Uva Wellassa University

**ජාතික සංවර්ධනය සඳහා සාඩම්බර දායකයකු වන්න**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සම්පත් ක්ෂේත්‍ර ඉලක්ක කොට රට වැඩි වටිනාකමක් ලබා දෙන නව ප්‍රවණතා නිර්මාණය කරයි. මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනික පාඨමාලා පළමු උපාධි, පශ්චාත් උපාධි, ආයතනික පුහුණු සහ වැඩිදුර අධ්‍යාපන ආදී ධාරා ඔස්සේ සේවායෝජකයන්ගේ නිෂ්පාදන වල අගයන් පුළුල් කරන කාර්යක්ෂම උපාධිධාරී පරපුරක් බිහි කරනු ඇත. මේ සඳහා දායක වීමට ඔබට කරන ඇරයුමයි.

# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

## ශිෂ්‍ය ප්‍රවේශය

## අධ්‍යයන වර්ෂ - 2017/2018

# අභියෝග්‍යතා පරීක්ෂණය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති "අධ්‍යයන වර්ෂ 2017/2018 සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය" පිළිබඳ වූ අත්පොතෙහි 1.2 ඡේදයෙහි දක්වා ඇති පරිදි අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් ඉහත අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පහත සඳහන් උපාධි පාඨමාලා වලට ඇතුළත්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම් කළ ශිෂ්‍යයන් අනෙකුත් අවශ්‍යතාවයන්ට අමතරව මෙම අභියෝග්‍යතා පරීක්ෂණය ද සමත් විය යුතුය.

- පරිගණක විද්‍යාව සහ තාක්ෂණය
- කාර්මික තොරතුරු තාක්ෂණය
- ව්‍යවසායකත්වය සහ කළමණාකරණය
- ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමණාකරණය

මෙම පරීක්ෂණය අයදුම් කරන ලද පාඨමාලාවට අදාල යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වනු ඇත.

මෙම විශ්වවිද්‍යාලයේ අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම් කිරීමේදී අයදුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා වූ ශිෂ්‍ය අත් පොතෙහි 2.2.8.15, 2.2.8.16, 2.2.8.18, සහ 2.2.8.21 යන කොටස් වෙත අවධානය යොමු කළ යුතුය.

අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා වන අයදුම් පත්‍රය ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙන් (www.uwu.ac.lk) ලබා ගත හැක. අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා වන ඔබගේ අයදුම් පත්‍රය **2018 පෙබරවාරි මස 19 වන දින** හෝ ඊට පෙර **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, විභාග අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කල යුතු අතර ලියුම් කවරයේ වම් පස ඉහල කෙළවරෙහි "**අභියෝග්‍යතා පරීක්ෂණය - 2017/2018**" ලෙස සඳහන් කළ යුතුය. පහත සඳහන් ලියකියවිලි අයදුම්පත සමග එවිය යුතුය.

i. **එක් විභාග ප්‍රශ්න පත්‍රයක් සඳහා** රු. 300/- බැගින් ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 78166821, ලංකා බැංකුව, බදුල්ල ශාඛාවට බැර කරන ලද බැංකු රිසිට් පත (කරුණාකර මෙම රිසිට්පතේ ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගන්න). මෙම ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

ii. අ.පො.ස. (උ.පෙළ) 2017 ප්‍රතිඵල සහතිකයෙහි ඡායා පිටපතක්.

iii. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

අභියෝග්‍යතා පරීක්ෂණය පවත්වනු ලබන්නේ **2018 මාර්තු මස 24වන** සෙනසුරාදා දින වන අතර එම අභියෝග්‍යතා පරීක්ෂණය ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. විභාග ප්‍රවේශ පත්‍ර තැපැල මගින් ඔබ වෙත එවීමට කටයුතු කරනු ලැබේ.

එක් එක් විභාග ප්‍රශ්න පත්‍රය සඳහා වෙනවෙනම අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් **වළකින** ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. කරුණාකර අයදුම් කරන සියලුම විභාග ප්‍රශ්න පත්‍ර සඳහා එක් අයදුම්පතක් පමණක් යොමු කරන්න.

විභාගය සඳහා ගෙවන ලද මුදල අයදුම් කරන ලද විභාග ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාවට වඩා අඩු නම්, අපේක්ෂකයා දක්වා ඇති කැමැත්තෙහි අනුපිළිවෙල අනුව ලබා දිය හැකි ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව සඳහා පමණක් සලකා බලනු ලැබේ.

**අභියෝග්‍යතා පරීක්ෂණය පවත්වනු ලබන මධ්‍යස්ථාන සහ ඊට අදාළ මධ්‍යස්ථාන අංකයන් පහත සඳහන් කර ඇත.**

| මධ්‍යස්ථාන | මධ්‍යස්ථාන අංකය |
|---|---|
| කොළඹ | 01 |
| යාපනය | 02 |
| නුවර | 03 |
| මාතර | 04 |
| බදුල්ල | 05 |
| අනුරාධපුර | 06 |

ඔබ අයදුම් කරන විභාග මධ්‍යස්ථානය ඔබ වෙත ලබාදීමට නොහැකි විට ඒ සඳහා සුදුසු වෙනත් විභාග මධ්‍යස්ථානයක් ඔබ වෙත ලබා දෙනු ලැබේ.

ලේඛකාධිකාරී
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
පස්සර පාර
බදුල්ල
16.01.2018

දුරකථන අංක 055-2226622
ෆැක්ස් 055-2226633
වෙබ් අඩවිය www.uwu.ac.lk